# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2072/50 - 2018 මැයි මස 25 වැනි සිකුරාදා - 2018.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2018 අංක 403/6

ජනා. කා. අංකය : පීඑස්/සීඑස්ඒ/00/5/9/1

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත (460 වන අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 19(1) හා (2) වන වගන්තිය ප්‍රකාරව, අතිගරු ජනාධිපතිතුමා විසින් වර්ෂ 2017 මැයි මස 23 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අවුරුදු තුනක කාලයක් සඳහා අංක 2027/23 හා 2017.07.12 දිනැති *ගැසට් නිවේදනය* මගින් පත් කරන ලද ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ දැනට සාමාජිකයෙකු ලෙස කටයුතු කරනු ලබන ඒ. එම්. පී. රාජකරුණා මහතා 2018.04.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම මණ්ඩලයේ උප සභාපතිවරයා ලෙස පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ඔස්ටින් ප්‍රනාන්දු,
ජනාධිපති ලේකම්.

2018 මැයි මස 22 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

06 - 488